# කුකුළන්ගේ ව්‍යාධිජනක සැල්මොනෙල්ලා පාලනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය

01. හැඳින්වීම

1992 අංක 59 දරණ සත්ත්ව රෝග පනත යනු ශ්‍රී ලංකාව තුල සත්ත්ව රෝග වැළැක්වීම හා පාලනය කිරීම, රට තුළට එවැනි රෝග පැමිණීම හා ව්‍යාප්තිය වැළැක්වීම සිදු කිරීම හා සම්බන්ධ ප්‍රධාන ප්‍රඥප්තියයි. 1992 අංක 59 දරණ එකී පනතේ පළමු උපලේඛනයේ කුකුලන්ට වැළදෙන පුල්ලෝරම් රෝගය කුරුළු උණ සන්නිපාතය පිළිබඳ පැහැදිලි කොට ඇත. එමඟින් ශ්‍රී ලංකාවේ කුකුළු පුල්ලෝරම් රෝගය හා කුරුළු උණ සන්නිපාතය වැළැක්වීම හා පාලනය සම්බන්ධයෙන් නිසි හා වගකිව යුතු අධිකාරිත්වය අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය වෙත පවරා ඇත.

බොහෝ බාධා මධ්‍යයේ ශ්‍රී ලංකාවේ කුකුළු කර්මාන්තය 2013 වර්ෂයේදී 15% ක අතිවිශිෂ්ඨ වාර්ෂික වර්ධනයක් වාර්තා කර ඇති අතර දැනට කුකුළු මස් නිෂ්පාදන මට්ටම පාර්භෝගිකයාගේ ක්‍රය ශක්තිය අනුව ස්වයං පෝෂිත මට්ටම අතික්‍රමණය කරමින් ලෝකයේ විවිධ රටවල් වෙත කුකුළු මස් අපනයනය සඳහා ද නැඹුරු වී ඇත. කුකුළු කර්මාන්ත අංශය, දළ දේශිය නිෂ්පාදනයේ 0.75% පමණ ආවරණය කරයි. කුකුළන් ඇති කිරීම යනු ප්‍රධාන ජීවනෝපාය හා ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත්වී ඇති අතර, කුකුළු ගොවිපළ කර්මාන්තය , දෙමාපිය කුකුළු පාලනය, වානිජ කුකුළු පාලනය හා කුකුළු නිෂ්පාදන සැකසුම් යන අංශ වලින් සමන්විත වේ. Grand parent සහ මව්පිය කුකුළු පාලනය සහිත දෙමාපිය කුකුළු ගොවිපළ පුළුල් රෝග නිරීක්ෂණය හා ආවේෂණය කිරීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කළමණාකරනය කිරීම තුළින් ගුණාත්මක බවින් යුක්ත එක් දිනක් වයසැති කුකුළු පැටවුන් නිෂ්පාදනය කිරීමට ද හැකිවී ඇත. මීට අමතරව වානිජ මට්ටමින් මස් පිණිස ඇති කරන කුකුළන් මිලියන 7.19ක් බිත්තර ලබා ගැනීමට සඳහා ඇති කරන සතුන් මිලියන 6.18ක් ද වශයෙන් දිවයින තුළ ඇස්තමේන්තු ගත කර ඇත. වර්තමානය වන විට සුදුසු නියාමන පද්ධතියක් දිවයින තුළ නොමැති වුව ද, කුකුළු නිෂ්පාදන සැකසීමේ අංශය සාර්ථකව ක්‍රියාත්මක වේ.

ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය යනු කුකුළු කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රධාන ආර්ථිකමය වශයෙන් වැදගත් රෝගයක් මෙන්ම මහජන සෞඛ්‍ය සඳහා ද බලපාන තිරණාත්මක රෝගයකි.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගයෙන් තොර තත්ත්වයක් ශ්‍රී ලංකාව තුළ පවත්වා ගැනීමට පියවර රැසක් ගෙන ඇති වුවත් වානිජ හා මාපිය කුකුළු ගොවිපළ තුළ සැල්මොනෙල්ලා ආසාධිත තත්ත්වයක් දක්නට ලැබේ. මෙම රෝගය ශ්‍රී ලංකාව තුළ ආවේණික රෝගයක් බවට පත්වුවහොත්, ඒ තත්ත්වය ශ්‍රී ලංකාවේ කුකුළු කර්මාන්තයට සහ එහි නිරත වන පුද්ගලයන්ගේ ජීවනෝපයට ද දැඩි බලපෑම් එල්ල කරනු ඇත. එබැවින් ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගයෙන් නිදහස් ශ්‍රී ලංකාවක් ඇති කිරීමට සියළු පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා මෙහි පහත සඳහන් පියවර ඇතුලත් වේ.

(අ) සත්ත්ව සෞඛ්‍ය ගැටළු හා මෙම රෝගය නිසා ඇතිවන ආශ්‍රිත මහජන සෞඛ්‍ය ගැටළු හඳුනා ගැනීම හා නිරාකරණය කිරීම සඳහා කුකුළු ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝග තත්වය අධීක්ෂණය කිරිම

(ආ) සියළු මට්ටම් ආවරණය කරමින් කුකුළු ව්‍යාධිජනක සැල්මොනෙල්ලාරෝගය විමර්ශන හා රෝග නීර්ණ කටයුතු සිදු කිරිම.

(ඇ) සැලමොනෙල්ලා රෝගයේ මහජන හා සත්ත්ව සෞඛ්‍ය ගැටළු පිළිබඳ මහ ජනතාවට දැනුම් දීම, දැනුවත් කිරීම හා ඒ පිළිබඳ බලගැන්වීම.

(ඉ) සැල්මොනෙල්ලා රෝගය පිලිබඳ හෝ ඊට සම්බන්ධ සත්ත්ව සෞඛ්‍ය මෙන්ම මහජන සෞඛ්‍ය ගැටළු හඳුනා ගැනීමට හා නිරාකරණය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හා ප්‍රජා සහභාගිත්වය බලමුලු ගැන්වීම

(ඊ) ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය පාලනය කිරීම උදෙසා ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම

(උ) පළාත් පාලන ආයතන, සෞඛ්‍ය බලධාරීන් හා අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළත් කර ගනිමින් ව්‍යාධිජනක සැලමොනෙල්ලා රෝගය සම්බන්ධයෙන් විවිධ ජාතික, පළාත් හා දිස්ත්‍රික් වැඩසටහන් අතර සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම

(ඒ) ශ්‍රී ලංකාවේ සැල්මොනෙල්ලා රෝගය වැළැක්වීම හා පාලනය කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීම.

(ඒ) කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය ශ්‍රම බලකායන් සහතික කිරීම.

(i) සත්ත්ව සෞඛ්‍ය හා පශු වෛද්‍ය සේවාව සම්බන්ධයෙන් එහි සඵලතාවය, පිවිසුම හා ප්‍රමිතිය ඇගයීම

02. **විශේෂිත අරමුණු** :

වර්ෂ 2025 වන විට කුකුළු ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගයෙන් නිදහස් ශ්‍රී ලංකාවක් ඇති කිරීම

03. **ඉලක්ක හා පොදු අරමුණු**:

3.1 **ඉලක්කය:**

විශේෂිත අරමුණු පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීම

3.2 **පොදු අරමුණු:**

(අ) සෑම අවදානම් ස්ථානයක් සඳහාම සුදුසු රෝග නිවාරණ හා ජෛව ආරක්ෂණ ක්‍රමවේද නියමිත අයුරින් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහතික වීම

(ආ) කාර්යක්ෂම මෙන්ම සුදුසු මැදිහත් වීම් සිදු කිරීමේ හැකියාව වැඩි කිරීම

(ඉ) මේ වෙනුවෙන් පෙනී සිටීම, හවුල් වීම හා ජාලකරණය ශක්තිමත් කිරීම

(ඊ) පර්යේෂණ ,ආවේක්ෂණය, අධීක්ෂණය හා ඇගයුම් කිරීම ශක්තිමත් කිරීම

(ඒ) කුකුළු ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය සම්බන්ධ 1992 අංක 59 දරණ සත්ත්ව රෝග පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම සම්බන්ධයෙන් සහතික වීම.

04. ප්‍රතිපත්ති ප්‍රකාශන:

4.1 සෑම අවදානම් ස්ථානයකදීම සුදුසු රෝග නිවාරණ හා ජෛව ආරක්ෂණ ක්‍රමවේද නියමිත අයුරින් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහතික වීම.

- ❖ ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීම සඳහා සැල්මොනෙල්ලා රෝගය සම්බන්ධ පුද්ගලයන්, පරිශ්‍රයන් හා නිෂ්පාදන හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. සැල්මොනෙල්ලා පාලනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියේ ඉලක්ක:

(අ) ශ්‍රී ලංකාවේ කුකුළු කර්මාන්තය හා සම්බන්ධ එමෙන්ම එහි කටයුතු කරන පුද්ගලයන්, ආයතන හා නිෂ්පාදන ලියාපදිංචි කිරීමටත්, හඳුනා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

(ආ) ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය මුලින් හඳුනා ගැනීම, නිවාරණය හා පාලනය කිරීම සඳහා අවශ්‍ය මනා සත්ත්ව පාලන හා කළමනාකරණ පිළිවෙත් ස්ථාපිත කිරීම, ප්‍රවර්ධනය හා බලාත්මක කිරීම

4.2 කාර්යක්ෂම හා සුදුසු මැදිහත්වීම් සිදු කිරීමේ හැකියාව වැඩි කිරීම

- ❖ සැල්මොනෙල්ලා රෝගය පාලනය කිරීම හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියෙන් පහත කරුණු ඉලක්ක කෙරේ.

(අ) සැල්මොනෙල්ලා රෝගය පාලනය සඳහා නිවැරදි තීරණ ගැනීමට හැකිවන පරිදි සියළු අංශ සම්බන්ධ කොටස් කරුවන්ගේ දැනුම්, ආකල්ප හා පරිචය (KAP) ධනාත්මක ලෙස ප්‍රවර්ධනය කිරීම

(ආ) සියළු අංශවල පාර්ශවකරුවන්ගේ දැනුම, ආකල්ප හා පරිචය (KAP)ධනාත්මක ලෙස වෙනස් කිරීම සඳහා එම ක්‍රියාවලියේ නියෝජිතයන් ලෙස ක්‍රියා කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය හා ව්‍යාප්ති කාර්යය මණ්ඩලයේ, අනෙකුත් බිම් මට්ටමේ නිලධාරින්ගේ මෙන්ම පෞද්ගලික අංශයේ කාර්යය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම.

(ආ) පාර්ශවකරුවන් අතර සැල්මොනෙල්ලා රෝගය පිළිබඳ ප්‍රමාණවත් තාක්ෂණික හා විද්‍යාත්මක තොරතුරු බෙදා හැරීම පිළිබඳ සහතික වීම

4.3 නියෝජනය, හවුල්වීම හා ජාලකරණය ශක්තිමත් කිරීම

- ❖ ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය තුරන් කිරීම සඳහාත් ඒ හා සම්බන්ධ ජාතික සංරචක හා අනෙකුත් ඒ හා සම්බන්ධ ප්‍රතිපත්ති හා වැඩසටහන් සඳහා උපදෙස් ලබා දීමටත්, සම්මුතිකරණය කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබේ.

සැල්මොනෙල්ලා රෝග පාලන ජාතික ප්‍රතිපත්තියෙන් පහත කරුණු අපේක්ෂා කෙරේ.

(අ) කුකුළු කර්මාන්තය තුළ ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගයෙන් තොර තත්ත්වයක් පිළිබඳ සහතික වීම සඳහා, දේශපාලන නායකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් හා අනෙකුත් පාර්ශවකරුවන් අතර නිරන්තර උපදෙස් ලබා ගැනීම හා සංවාද ඇති කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

(ආ) සැල්මොනෙල්ලා රෝග පාලනය සඳහා සහයෝගිතා වැඩසටහන් ආරම්භ කිරීම වෙනුවෙන් පුද්ගලික අංශයද ඇතුළුව අදාළ අංශ හා පාර්ශවකරුවන්ගේ සහයෝගිතාවය හා සම්බන්ධතාවය ශක්තිමත් කිරීම

4.4 පර්යේෂණ, ආවේක්ෂණ, අධීක්ෂණ හා ඇගයුම් කටයුතු ශක්තිමත් කිරීම

- ❖ සාක්ෂි මත පදනම් වූ වැඩසටහන් සැලසුම් කිරීමේ දී හා කළමනාකරණය කිරීමේ දී සැල්මොනෙල්ලා රෝගය සම්බන්ධයෙන් කාලෝචිත තොරතුරු හා යාවත්කාලීන දැනුම ඉතා වැදගත් වේ. ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය පාලනය කිරීමේ ජාතික ප්‍රතිපත්තියෙන් පහත සඳහන් කරුණු ඉටු කෙරේ.

(අ) ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය මුලිනුපුටා දැමීම සඳහා වූ වැඩසටහන් මනා ලෙස කළමනාකරණය කිරීම වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදකයන්, පරිපාලකයන් හා කුකුළු කර්මාන්ත කරුවන් සඳහා ජාතික සැල්මොනෙල්ලා ආවේක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට හා එය ක්‍රියාත්මක කිරීමට අනුබල දීම.

(ආ) ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝග පාලන වැඩසටහන් පිළිබඳ නිරන්තර අධීක්ෂණ කටයුතු හා කාලීන ඇගයුම් කටයුතු සඳහා පර්යේෂණ මූලික කොට ගත් ක්‍රියාකාරකම් මෙන්ම සාක්ෂි භාවිතා කිරීම හා පර්යේෂණික සොයාගැනීම් සඳහා මූලිකත්වය ලබා දීම හා සහයෝගය ලබා දීම.

4.5 කුකුළු ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය සම්බන්ධයෙන් 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතේ සහ 1986 අංක 15 දරණ සත්ත්ව ආහාර පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම සම්බන්ධයෙන් සහතික වීම.

- ❖ 1992 අංක 59 දරන සත්ත්ව රෝග පනත යනු මෙරට සත්ත්ව රෝග වැළැක්වීම හා සම්බන්ධ ප්‍රඥප්තිය වේ. එකී පනතේ උපලේඛනයේ දක්වා ඇති පරිදි සැල්මොනෙල්ලා රෝගය යනු කුකුළන්ට බලපාන රෝගයක් වන අතර, ශ්‍රී ලංකාවේ කුකුළු කර්මාන්ත ආරක්ෂා කර ගැනීම හා මහජන සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීම සඳහා ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය වැළැක්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වගකීමට බැඳී සිටියි. සැල්මොනෙල්ලා රෝගය පාලනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය මඟින් පහත සඳහන් කරුණු පිළිබඳව නව නීති රීති පැනවීමටත් ක්‍රියාත්මක කිරීමත් සිදු වේ.

(අ) කුකුළු ගොවිපළ (කුකුළු අභිජනන ගොවිපළ ඇතුලත්ව) බිත්තර රක්කනාගාර සහ කුකුළු නිෂ්පාදන හා සම්බන්ධ කටයුතු සිදු කරන ස්ථාන (කුකුළු නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන, කුකුළු මස් කඩ වැනි ආයතන) ලියා පදිංචි කිරීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම, එවැනි ආයතන සඳහා මනා කළමනාකරණ ක්‍රම ප්‍රවර්ධනය කිරීම හා බලාත්මක කිරීම

(ආ) කුකුළු නිෂ්පාදන පරීක්ෂා කිරීමේ හා සහතික කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

05. ක්‍රියාත්මක කිරීම

- ❖ සැල්මොනෙල්ලා පාලන ජාතික ප්‍රතිපත්තිය සම්පාදනයෙන් පසුව එය පදනම් ලේඛනයක් (Base document) ලෙස ක්‍රියා කරනු ඇත. එය පදනම් කරගනිමින් ක්‍රියාත්මක අදියර දක්වා ක්‍රමෝපායික ප්‍රවේශ නිර්මාණය කෙරේ.
- ❖ මෙම ප්‍රතිපත්තිය හොඳින් වගකීම් දරන නිලධාරින් සහ විවිධ මට්ටමේ සවිබල ගැන්වීමේ ක්‍රියාවලීන් හරහා ක්‍රියාත්මක වේ.

(අ) ජාතික මට්ටමේදී

i. සැල්මොනෙල්ලා ජාතික ප්‍රතිපත්තියේ මෙහෙයුම් කමිටුව

මෙම කමිටුව විසින් ජාතික වශයෙන් වැදගත් වූ ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන අතර කටයුතු අධීක්ෂණය සිදු කරනු ලබයි. මෙම කමිටුව පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වේ.

1) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපර්තමේන්තුව අයත් අමාත්‍යංශ ලේකම් මෙහි සභාපතීත්වය දරයි.
2) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරනු ලබන ඕනෑම ජ්‍යෙෂ්ඨ පශු වෛද්‍ය නිලධාරියෙකු:
3) සෞඛ්‍ය සේවයේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් නම් කරන සෞඛ්‍ය අමාත්‍යංශයේ ඕනෑම ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු:
4) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් හෝ ඔහු විසින් නම් කරන භාණ්ඩාගාරයේ ඕනෑම ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු:
5) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පුද්ගලික අංශයේ කුකුළු කර්මාන්තයේ නිරත නියෝජිතයෙකු:

ii. සැල්මොනෙල්ලා ජාතික ප්‍රතිපත්තියේ තාක්ෂණික කමිටුව

මෙම කමිටුව විසින් වැදගත් තාක්ෂණික තීරණ ගැනීම, ක්‍රියාත්මක සැලැස්ම කාලානුරූපීව සමාලෝචනය කිරීම හා ප්‍රමුඛ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සිදු කරයි.
එය පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වේ.

1) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සභාපති ලෙස කටයුතු කරයි.
2) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්( සත්ත්ව සෞඛ්‍ය) සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පශු පර්යේෂණ)
3) අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය) අධ්‍යක්ෂ (පශු පර්යේෂණ) ශාඛානුවේදය පිළිබඳ ප්‍රධාන විද්‍යාඥ, ප්‍රධාන වසංගත රෝග විශේෂඥ, පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ ප්‍රධාන පශු විමර්ශණ විශේෂඥ .
4) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පුද්ගලික අංශයේ කුකුළු ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණයෙකු:
5) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක කුකුළු විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු:

(ආ) සැල්මොනෙල්ලා ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ පළාත් සම්බන්ධිකරණ කමිටුව

පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු පළාත් අධ්‍යක්ෂ මෙම කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි.

පහත සඳහන් නිලධාරින් ගෙන් කමිටුව සමන්විතවේ

1) නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂවරු
2) අදාළ විෂයානුබද්ධ විශේෂඥ
3) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරින්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්
4) පළාතේ පශු විමර්ෂන නිලධාරින්

**ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය**
**අමාත්‍යමණ්ඩල සංදේශය**

**<u>කුකුළන්ගේ</u>** <u>ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය පාලනය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය</u>

කුකුළු කර්මාන්තය යනු ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වන කර්මාන්තයකි.මේ වන විට කුකුළු මස් නිෂ්පාදනය ස්වයං පෝෂිත මට්ටම ඉක්මවා වර්ධනය වී ඇති අතර, අපනයනය වෙළඳපොල දක්වා නැඹුරු වී ඇත.

කුකුළු ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය යනු ආර්ථික වශයෙන් කුකුළු කර්මාන්තයට බලපෑම් සිදු කරන ඉතා බරපතල රෝගයකි.ඊට අමතරව කුකුළන්ගේ දැකිය හැකි සමහර සැල්මොනෙල්ලා බැක්ටීරියා වර්ග මහජන සෞඛ්‍ය කෙරෙහිද බලපායි. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සැල්මොනෙල්ලා රෝගයෙන් තොර තත්වයක් ශ්‍රී ලංකාවේ ඇති කිරිම සඳහා පියවර රාශියක් ගෙන ඇති මුත්, කුකුළු ගොවිපල ක්ෂේත්‍රයේ තවමත් මෙම ගැටළුව පවතී. මෙම රෝගය ශ්‍රී ලංකාව තුළ මුල් බැසගත් රෝග තත්වයක් බවට පත්වුවහොත් එය, කුකුළු කර්මාන්තයට අදාල ජීවනෝපාය මාර්ග අහිමිවීම, ආහාර අනාරක්ෂිතභාවය, අපනයන ආදායම් අහිමි වීම සහ විදේශ විනිමය අහිමි වීම වැනි කරුණු නිසා සමස්ථ කුකුළු කර්මාන්තය කෙරෙහිම බලපානු ඇත. එබැවින් මෙම රෝගය මෙරටින් තුරන් කිරිම සඳහා, බිත්තර හා මස් සඳහා කුකුලන් ඇති කිරිමේ ගොවිපල් බිත්තර හා කුකුළු මස් සැකසීම, බෙදා හැරීම, හා අලෙවිකරණය යන විවිධ මට්ටම් වල දී විවිධ පියවර ගැනිම අත්‍යාවශ්‍ය වේ.

සැල්මොනෙල්ලා රෝග පාලනය කිරීමේ අරමුණෙන් මාගේ අමාත්‍යාංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, සහ මෙම ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුව මේ සමඟ අමුණා ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ කුකුළු ව්‍යාධිජනක සැල්මොනෙල්ලා රෝගය පාලනය කිරීම සඳහා මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා රජයේ ජාතික ප්‍රතිපත්තිය වශයෙන් භාවිත කිරීමට මෙන්ම ප්‍රකාශයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි.

පි.හැරිසන්
ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය,